# HAP Humanitarian Accountability Partnership

"making humanitarian action accountable to beneficiaries"

(මානුෂීය වගවීම් හවුල්කාරත්වය-"මානුෂීය ක්‍රියාකාරකම් වෙනුවෙන් ප්‍රතිලාභීන්ට වගවීම")

# වගවීම පිළිබඳ මූලධර්මයන්

1) මානුෂීය ප්‍රමිතීන් හා හිමිකම් වෙනුවෙන් ඇති කැපවීම
   ප්‍රතිලාභීන්ගේ හිමිකම් හා මානුෂීය ප්‍රමිතීන්ට ගරු කිරීමට හා ඒවා සුරැකීමට තමා තුළ ඇති කැපවීම සම්බන්ධයෙන් සාමාජිකයෝ ප්‍රකාශකර සිටිති.

2) ප්‍රමිතීන් ඇති කිරීම හා ධාරිතා වර්ධනය
   සිය පාර්ශවකරුවන් වෙනුවෙන් සාමාජිකයන් විසින් වගවීම පිළිබඳ රාමුවක්* ගොඩ නගනු ලබයි. සාමාජිකයන් විසින් සිය ප්‍රමිති හා කාර්ය සාධන දර්ශක තනා ගනිමින් වරින් වර මේවා සමාලෝචනය කර අවශ්‍ය වූ විට සංශෝධනය කිරීම කරනු ලැබේ.

3) සන්නිවේදනය
   තමා විසින් යොදාගන්නා ලද ප්‍රමිති සම්බන්ධයෙන් මෙන් ම සිදු කළ යුතු වැඩසටහන් හා පවත්නා ගැටලු ආමන්ත්‍රණය කිරීමේ යන්ත්‍රණයන් සම්බන්ධයෙන් පාර්ශවකරුවන්, ප්‍රතිලාභීන් හා කාර්ය මණ්ඩලය වෙත දැනුම් දීම හා ඔවුන්ගේ අදහස් ලබා ගැනීම සිදු කරනු ලැබේ.

4) වැඩසටහන්වලට සහභාගී වීම
   ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී බරපතල බාධාවන් ඇතිවිටදී පමණක් වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම ඇතුළු ප්‍රගති වාර්තාකරණය යන අවස්ථාවන්හිදී සාමාජිකයින් විසින් ඒ සඳහා ප්‍රතිලාභීන් සහභාගී කර ගැනීම කරනු ලබයි.

5) අනුකූලතාවය පිළිබඳ අධීක්ෂණය සහ වාර්තා කිරීම
   ප්‍රමිතීන් අධීක්ෂණය කිරීමේදී හා සංශෝධනය කිරීමේ දී සාමාජිකයන් විසින් ප්‍රතිලාභීන් හා කාර්ය මණ්ඩලය සහභාගී කර ගැනීම සිදු වේ.
   වැඩසටහන් ප්‍රමිතියට අනුකූල වේ දැයි ශක්තිමත් ක්‍රියාවලියක් තුළින් අධීක්ෂණය හා ඇගයීමට ලක් කෙරේ. ප්‍රමිතීන් වල ඇති අනුකූලතාවය පිළිබඳ සාමාජිකයින් විසින් අවම වශයෙන් වසරකට වරක් හෝ පාර්ශවකරුවන් සහ ප්‍රතිලාභීන් වෙත වාර්තා කිරීම කරනු ලැබේ. මෙම වාර්තා කිරීම විවිධ ස්වරූපයෙන් සිදු විය හැකිය.

6) පැමිණිලි විභාග කිරීම
   පැමිණිලි ඉදිරිපත් කිරීමට ප්‍රතිලාභීන්ට හා කාර්ය මණ්ඩලයට අවස්ථාව ලබා දී ඇති අතර ඒ සඳහා ආරක්ෂිතව පිළියම් යෙදීම සිදු කෙරේ.

7) හවුල්කරුවන් සහභාගීකරවා ගැනීම
   හවුල්කරුවන් සහභාගී කර ගැනීමේ දී මෙම මූලධර්මයන් ක්‍රියාත්මක කිරීමට සාමාජිකයෝ බැඳී සිටිති.

* මෙම රාමුවට ප්‍රමිති, තත්ත්ව ප්‍රමිති, මූලධර්ම, ප්‍රතිපත්ති, මාර්ගෝපදේශන, පුහුණු හා සෙසු ධාරිතා සංවර්ධන කටයුතු ආදිය අයත් වේ. මෙයට මැනිය හැකි කාර්ය සාධන දර්ශක ද ඇතුළත් විය යුතුය. ප්‍රමිති එක් එක් සංවිධානයට අනන්‍ය හෝ පොදු විය හැකිය. උදා ස්ෆියර් ප්‍රමිතීන් හෝ පීපල් ඉන් ඒඩ් ප්‍රමිතීන්.

පරිවර්තන හා මුද්‍රණ අනුග්‍රහය Lutheran World Relief — To others, through others.

July 2009

www.hapinternational.org